විෂයය : - සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය :- 11

වාරය :- 02

ඒකකය :- ප්‍රත්‍යයාර්ථ නාම

ඉගෙනුම් පල :-

- ප්‍රත්‍යයාර්ථ නාම හඳුනා ගෙන නම් කරයි.
- තද්ධිත පද සෑදෙන අයුරු විස්තර කරයි.
- කෘදන්ත පද සෑදෙන අයුරු විස්තර කරයි.
- තද්ධිත හා කෘදන්ත හඳුනා ගෙන ලේඛනයේ යෙදෙයි.

## ක්‍රියාකාරකම i

1. වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. ප්‍රත්‍යය යනු පදයකට එක්ව ඇති අකුරකි.
ii. ප්‍රත්‍යය යනු පද සාධනයට සම්බන්ධ කොටසකි.
iii. ප්‍රත්‍යය යනු ප්‍රකෘතියකින් පරව අර්ථවත් වූ පද සාධනය සඳහා එකතු වන කොටසකි.
iv. පදයක මූලය ප්‍රත්‍යය යි.

2. ප්‍රත්‍යයාර්ථ නාම සඳහා යෙදෙන නමක් නො වන්නේ

i. පසරුත් සඳ
ii. ප්‍රත්‍යය සංග්‍රහ නාම
iii. ප්‍රත්‍යයාර්ථ ශබ්ද
iv. ප්‍රකෘති නාම

3. ප්‍රත්‍යයාර්ථ නාම ගණයට අයත් පද පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

i. සමාස හා කෘදන්ත
ii. තද්ධිත හා සන්ධි
iii. ලිංග හා විභක්ති
iv. තද්ධිත හා කෘදන්ත

4. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. නාම  ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක් වීමෙන් සෑදෙන ප්‍රත්‍යයාර්ථ නාම කෘදන්තයි.
ii. ධාතු ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක් වීමෙන් සෑදෙන ප්‍රත්‍යයාර්ථ නාම තද්ධිතයි.
iii. ආඛ්‍යාත ප්‍රකෘතියකට ප්‍රත්‍යයක් එක් වීමෙන් සෑදෙන ප්‍රත්‍යයාර්ථ නාම කෘදන්තයි.

iv. නාම ප්‍රකෘතියකට විභක්ති ප්‍රත්‍යයක් එක් වීමෙන් සෑදෙන ප්‍රත්‍යයාර්ථ නාම තද්ධිතයි.

5. මුනිදාස කුමාරතුංග සූරීන් දක්වා ඇති තද්ධිත ප්‍රමාණය නිවැරදිව සඳහන් වරණය තෝරන්න.

i. 14 කි.
ii. 23 කි.
iii. 30 කි.
iv. 24 කි.

## ක්‍රියාකාරකම ii

1 පහත දැක්වෙන තද්ධිත පද යොදා වගුව සම්පූර්ණ කරන්න.

නියැරි, රැටි, නැවි, දැහැමි, කැමි, නැකති, කැබලි, මැඳිරි, වැදලි

| භූතාර්ථය | නියුක්තාර්ථය | ජාතනාර්ථය | ස්වාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |

2. පහත දක්වා ඇති එක් එක් අදහස සඳහා අස්ත්‍යාර්ථ තද්ධිත ප්‍රත්‍යය යොදා තද්ධිත පද සාදන්න.

i. බුද්ධිය ඇත්තේ ----------------------------------
ii. ප්‍රීතිය ඇත්තේ ----------------------------------
iii. ඥානය ඇත්තේ --------------------------------
iv. යහපත් චරිතයක් ඇත්තේ ----------------------
v. කාන්තිය ඇත්තේ ------------------------------

3. පහත සඳහන් තද්ධිත පදවල අර්ථය ලියන්න.

i. කදාමය --------------------------------
ii. රුවන්මුවා ----------------------------
iii. සෙල්මුවා -----------------------------
iv. පුණ්‍යමය -----------------------------
v. මනෝමය ----------------------------

4. පහත සඳහන් තද්ධිත පදවල ප්‍රකෘති ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

i. අරටුව --------------+--------------
ii. කරටිය -------------+--------------

iii. කොපුලත් ----------+-------------
iv. මුහුළස් -------------+-------------
v. ඉහළ ---------------+-------------

5. තද්ධිතයක් යෙදී නොමැති වරණය තෝරන්න.

i. රන්මුවා, සෙල්මුවා, රිදීමුවා, දැවමුවා
ii. කැදලි, මැඳිරි, සොඳුරි, ඇඳිරි
iii. මොළකැටි, ඉඟටි, දිගටි, තුනටි
iv. ප්‍රියතර, මධුරතර, ප්‍රණීතතර, උදාරතර

## ක්‍රියාකාරකම iii

1. 'පුද්ගල' යන්නට 'ඉක' ප්‍රත්‍යය එක් වූ විට 'පෞද්ගලික' ලෙස සෑදේ නම්; පහත ප්‍රකෘතීන්ගෙන් සෑදෙන පද ලියන්න.

i. දින --------------------
ii. භූත -------------------
iii. සිද්ධාන්ත -------------
iv. කර්ම ------------------
v. අධ්‍යාපන -------------

2. මේ එක් එක් අදහස සඳහා යෝග්‍ය තද්ධිත පද ලියන්න.

i. ගරු කටයුතු මුත්තා -----------------------
ii. සමාජයට අයත් ----------------------------
iii. අබ ඇටයක් තරම් ඉතා සුළු දෙයක් ----------------
iv. මනා හැදීමක් ඇති බව ----------------------------
v. පිවිතුරු බව ඇති ---------------------------------

3. 'සෞභාග්‍යය' යන පදය ප්‍රකෘති ප්‍රත්‍යය වශයෙන් වෙන් කළ විට 'සුභග+ය' ලෙස සිටියි නම්; පහත සඳහන් තද්ධිත පද ප්‍රකෘති ප්‍රත්‍යය වශයෙන් වෙන් කළ කල්හි යෙදෙන ආකාරය දක්වන්න.

i. සෞඛ්‍ය -----------------------
ii. සෞන්දර්ය -----------------------
iii. කෞශල්‍ය -----------------------
iv. වෛකල්‍ය -----------------------
v. ධෛර්ය -----------------------

4. දී තිබෙන ප්‍රකෘතීන් හා ප්‍රත්‍යයන් සුදුසු පරිදි එක් කරමින් තද්ධිත පද නිර්මාණය කොට වගුව සම්පූර්ණ කරන්න.

| ප්‍රකෘතිය | ප්‍රත්‍යය | තද්ධිත පදය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

බැහැර, වක, සිසිල්, සෙනෙහෙ, චතුර, පාෂාණ, ප්‍රථම, තෙර, ඇඬි, නව, ප්‍රබල

අස්, ඉක, ආ, ත්ව, අටු, වත්, මය, තා, තන, අණු, ඉ

5. පහත සඳහන් ඡේදයේ අන්තර්ගත තද්ධිත පද උපුටා දක්වන්න.

''මෙකල ශ්‍රී ලංකාවෙහි සිදු වෙමින් පවත්නා නව ආගමික අභිවෘද්ධික ව්‍යාපාරය ගැන අසා පැහැදුණු අශෝක රජතුමා බුද්ධගයාවෙහි බුදුන් වහන්සේ බුද්ධත්වය ලද ස්ථානයෙහි මහා බෝධියෙන් ලබා ගත් ශාඛාවක් ද සමඟ ස්වකීය දියණිය වූ සංඝමිත්තා තෙරණිය ලංකාවට එවී ය. බෝධි අංකුරය සමඟ විවිධ සමාජ ශ්‍රේණීන්ට අයත් වූ ශිල්පීන් රැසක් ද අශෝක රජු විසින් ලංකාවට එවනු ලැබිණි. ඔවුහු තාම්‍රලිප්ති තොටින් නැව් නැගී ලක්දිව දඹකොළ තොටින් ගොඩ බැස්සාහ.''

## ක්‍රියාකාරකම V

1. නිවැරදි ප්‍රකාශය තෝරන්න.

   i. කෘදන්ත පද සෑදෙන්නේ නාම ප්‍රකෘති මුල් කර ගෙන ය.
   ii. කෘදන්ත යනු ධාතු ප්‍රකෘතියක් මූලික කොට ගෙන සෑදෙන පද වර්ගයකි.
   iii. කෘදන්ත යනු ප්‍රත්‍යය මූලික පද වර්ගයක් නො වෙයි.
   iv. කෘදන්ත පදවල වරනැඟීමක් සිදු නො වෙයි.

2. වගුව සම්පූර්ණ කරන්න.

| ධාතුව | කෘදන්ත ප්‍රත්‍යය | කෘදන්ත පදය |
|---|---|---|
| ලිය/කප | + න | ලියන/ කපන |
| | + නු | |
| | + ඊම් | |
| | + උම් | |
| | + ඉලි | |
| | + මන් | |

3. පහත සඳහන් වාක්‍යවල හිස්තැන්වලට වාක්‍යය ඉදිරියේ දී තිබෙන ධාතුවෙන් සුදුසු කෘදන්ත පද සාදා යොදන්න.

i. --------------කාර්යාලයට පැමිණ, මේසය ළඟ වාඩි වී, ------------------ කීපයක් කඩිනමින් යතුරු ----------- කොට වෙනත් වැදගත් -------------- කීපයක් ද සමග ආයතන ප්‍රධානියාට භාර දුන්නේ ය. (ලිය)

ii. වඩුවා ලීයක් --------------- විට එයින් ගැල වී වීසි වුණ පතුරක් වැදී ඇති වූ ----------------- තුවාලයට ප්‍රතිකාර ගැනීම සඳහා රෝහලට ගිය විට ------------- එකතු කොට මහන ගමන් වෛද්‍යවරයා අසල සිටි හෙදියට කියා සිටියේ අපේ රෝහලේ තරම් --------------- සිදුවන ආයතනයක් තවත් නැත යනුවෙනි. (කප)

iii. ඇය ඉදිරිපත් කළ මනරම් ----------- වර්තමාන --------------කලාවේ සන්ධිස්ථානයක් බව විචාරකයා පවසන විට, එයා තිරය පිටුපස ඔයිට වඩා හොඳ ------------- පෙන්නූ බව සභාවේ සිටි අයකු සෙමින් කීවේ ය. (නට)

iv. කතන්දර -------- මෙන් ම ඇසීම ද රසවත් අද්දැකීමක් වන අතර ඒවායෙහි එන සමහර ---------- මුවහත් නිසා එයින් කියවන්නාගේ භාෂාවද මනාව වැඩෙයි. (කිය)

v. ----------- විසින් මේ ලෝකය --------- ලද නම් සියලු දේ සර්වබලධාරී දෙවි කෙනෙකුගේ ------------- අනුව සිදුවන බව ද සිතීමට සිදු වෙයි. (මව)

4. කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

i. නටන, කියන, බලන, ලියන
ii. ගැයුම්, වැයුම්, කැලුම්, තැළුම්
iii. ඉවසිලි, සැනසිලි, රැකිලි, බැලිලි
iv. කඩනය, අඳනය, ලියනය, දවටනය

5. පහත සඳහන් පද්‍යයෙහි අන්තර්ගත කෘදන්ත පද උපුටා දක්වන්න.

i. ''විදෙන ලෙළෙන නරු බර පුළුලුකුළ සැදී
හෙළන නඟන අග නුවනග බැලුම් දිදී
රුවින දිලෙන අබරණ කැලුම ගත යෙදී
සැලෙන පහන සිළු වැනි රඟන ලිය සැදී''

## පිළිතුරු

### ක්‍රියාකාරකම i

1. - iii 2- iv 3- iv 4- iii 5- ii

### ක්‍රියාකාරකම ii

1.

| භූතාර්ථය | නියුක්තාර්ථය | ජානනාර්ථය | ස්වාර්ථය |
|---|---|---|---|
| ගැමි | නැවි | නැකති | කැබලි |
| රැටි | දැහැමි | | මැඳිරි |
| | කැමි | | වැදලි |

2.

i. බුද්ධිමත්
ii. ප්‍රීතිමත්
iii. ඥානවන්ත
iv. චරිතවත්
v. කාන්තිමත්

3.

i. වීදුරුවෙන් කරන ලද
ii. මාණික්‍යයෙන් කරන ලද
iii. සෙලින් හෙවත් ගලින් කරන ලද
iv. පිනෙන් කරන ලද
v. මනසින් කරන ලද

4.

i. හර/අර+අටු
ii. කර+අටි
iii. කොපුල්+අත්
iv. මුහුළ+අස්
v. ඉස්+අළ

5. ii

ක්‍රියාකාරකම iii

1.

i. දෛනික
ii. භෞතික
iii. සෛද්ධාන්තික
iv. කාර්මික
v. ආධ්‍යාපනික

2.

i. මුත්තණුවෝ
ii. සමාජීය
iii. ඇබිති
iv. හැදියා
v. පවිත්‍රතා

3.

i. සුබ+ය
ii. සුන්දර+ය
iii. කුශල+ය
iv. විකල+ය
v. ධීර+ය

4.

| ප්‍රකෘතිය | ප්‍රත්‍යය | තද්ධිත පදය |
|---|---|---|
| බැහැර | ඉ | බැහැරි |
| වක | අටු | වකුටු |
| සිසිල් | අස් | සිසිලස් |
| සෙනෙහෙ | වත් | සෙනෙහෙවත් |
| චතුර | තා | චතුරතා |
| පාෂාණ | මය | පාෂාණමය |
| ප්‍රථම | ඉක | ප්‍රාථමික |
| තෙර | අණු | තෙරණු |
| ඇඩ් | ආ | ඇඩියා |
| නව | තත | නූතන |
| නවීන | ත්ව | නවීනත්ව |

5. ආගමික, අභිවෘද්ධික, බුද්ධත්වය, ස්වකීය, දියණිය, තෙරණිය, ශිල්පීන්

ක්‍රියාකාරකම v

1. ii

2.

| ධාතුව | කෘදන්ත ප්‍රත්‍යය | කෘදන්ත පදය |
|---|---|---|
| ලිය/කප | +න | ලියන/කපන |
| | +නු | ලියනු/කපනු |
| | +ඊම් | ලියීම්/කැපීම් |
| | +උම් | ලියුම්/කැපුම් |
| | +ඉලි | ලියිලි/කැපිලි |
| | +මන් | ලියමන්/කැපුමන් |

3.

i. ලියන්නා, ලියුම්, ලියනය, ලියවිලි
ii. කපන, කැපුම්, කැපීම්, කැපිලි
iii. නැටීම, නැටුම්, නැටිලි
iv. කීම, කියුම්
v. මැවුම්කරුවකු, මවන, මැවීම්

4. ii

5. විදෙන, ලෙළෙන, හෙළන, නගන, බැලුම්, දිලෙන, සැලෙන, රඟන